60038

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංග කලා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2016

විෂයමාලා න්‍යාය සහ පරිචය – ESU3129

කාලය : පැය (03) තුනයි.

---

දිනය - 2016 අප්‍රේල් 07 　　　　 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. විෂයමාලාව සහ විෂය නිර්දේශය අතර වෙනස පැහැදිලි කරන්න.

02. විෂයමාලා සංවර්ධන ආකෘතියක් යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න

03. ඉගෙනුම් අරමුණු තෝරා ගැනීමේදී සැළකිය යුතු කරුණු ලැයිස්තු ගත කරන්න.

04. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් අධ්‍යාපනය සහ වැඩ ලෝකය සම්බන්ධ කිරීමට ගත් උත්සාහය අගයන්න.

05. විෂයමාලා කළමනාකරණයේ අවස්ථා සඳහන් කරන්න.

06. විෂය සන්ධාරය තෝරා ගැනීමේ මූලික නිර්ණායක පහක් (05) ලැයිස්තු ගත කරන්න.

07. සැඟවුණු විෂයමාලාව යන්නෙන් කුමක් අදහස් වේදැයි පැහැදිලි කරන්න.

08. පාසල්හි පවතින විෂමතාවන් විධිමත් විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට බලපාන අයුරු විමසන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) 'විෂයමාලාව' යන පදය සඳහා නිර්වචන දෙකක් (02) දක්වන්න. (ලකුණු 08)

(ii) එම නිර්වචන ඇසුරින් විෂයමාලාවෙහි අඩංගු වියයුතු අංග හතරක් (04) හඳුනා ගන්න. (ලකුණු 06)

(iii) ඉහත දක්වන ලද අංග සැළකිල්ලට ගනිමින් 'විෂයමාලාව' යන පදය සඳහා ඔබගේම නිර්වචනයක් සකසන්න. (ලකුණු 06)

10. (i) ටයිලර්ගේ විෂයමාලා ආකෘතිය පැහැදිලි කර එහි දුබලතා හඳුන්වා දෙන්න. (ලකුණු 10)

(ii) එම දුබලතා වීලර්ගේ ආකෘතියෙන් මඟහරවා ගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) විෂයමාලා සැලසුම්කරණයේ දී සළකා බැලිය යුතු මනෝවිද්‍යාත්මක සාධක තුනක් (03) පරීක්ෂා කරන්න. (ලකුණු 12)

(ii) විෂයමාලා සැලසුම්රණයේ දී පියාජේගේ අදහස් හි භාවිතයේ වැදගත්කම විමර්ශනය කරන්න. (ලකුණු 08)

12. (i) විෂයමාලා කළමනාකරණය සහ විෂයමාලා ඇගයීම අතර වෙනස දක්වන්න. (ලකුණු 05)

(ii) විෂයමාලා ඇගයීමේ විවිධ ආකෘති ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)

(iii) ඉහත සඳහන් කළ ආකෘති අතුරින් එකක් තෝරාගෙන විෂයමාලා ඇගයීමේදී එහි කාර්යක්ෂමතාව පරීක්ෂා කරන්න. (ලකුණු 12)

13. (i) විෂයමාලා සංවිධාන ප්‍රවේශ හතර (04) නම් කරන්න. (ලකුණු 04)

(ii) ඉන් එක් ප්‍රවේශයක් තෝරාගෙන එහි ස්වභාවය, කැපීපෙනෙන ලක්‍ෂණ, වැදගත්කම සහ දුර්වලතා සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) තෝරාගත් එක් ප්‍රවේශයක් ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව සංවිධානයේ දී සැලකිල්ලට ගෙන ඇති අයුරු පරීක්‍ෂා කරන්න. (ලකුණු 08)

14. පහත මාතෘකා අතුරින් ඕනෑම දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න.

(i) විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම්වලින් ලැබෙන පිටුබලය

(ii) අධ්‍යාපනය සහ මනෝවිද්‍යාව අතර ඇති සම්බන්ධය

(iii) විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජා සහාය ලබා ගැනීම

(iv) කර් (Kerr) ට අනුව විෂයමාලාවක ඇගයීම සිදුකරන අයුරු

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.